**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

**මහනුවර දිස්ත්‍රික්කය**

---

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද , ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන, 2010 මාර්තු 31 දින ද ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවටත්,මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට රු.92,155 ක අත ඉතිරිය ශේෂ පත්‍ර සටහන් 08 හි නිලධාරීන් වෙත ඇති මුදල් යටතේ අනාවරණය කල යුතු වුවත්, එසේ නොකර මුදල් පොතේ ශේෂයටතේ දක්වා තිබුණි.

(ආ) දෙවන ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතියට සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.3,058,755 ක හිඟ සහා දායකය සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට සේවක ඇප වශයෙන් තැන්පත් කර තිබූ රු.16,958 ක ශේෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2010 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණයශේෂය රු.554,674 ක් වුවද, ණය ප්‍රාග්ධනය යටතේ රු.241,604 ක් පමණක් ගිණුම් ගත කිරීම හේතුවෙන් එම අරමුදලේ ණය ශේෂය රු.313,070 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වැඩිපුර ගෙවූ වැටුප් නැවත අයකර ගැනීම ගිණුම්ගත කිරීම ජ'නල් සටහන් 41 න් සිදුකර තිබුණ අතර, වෙනත් ආදායම් ගිණුමට රු.12,512 ක් හර කිරීම හේතුවෙන් වෙනත් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 02 කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 581,827 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 521,824 ක් විය.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු. 269,804 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 37,782,123 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ඉඩම් ආඥා පනතේ 27 වන වගන්තිය | රු.272,945 ක වටිනාකමකින් යුත් ඉඩම් කැබලි 07 ක අයතිය තහවුරු කර නොතිබුණි. |
| (ආ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගු ලාසි සංග්‍රහය</u> මු.රෙ. 1645 | සභාව සතු වාහන 05 කට අදාලව 2008 සහ 2009 වර්ෂවල දෛනික ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි |
| (ඇ) මුදල් කොමිෂන් සභාවේ ලේකම්ගේ 2003 මාර්තු 06 දිනැති අංක ඒපිසි/ 1/ පිඑස්ජ්ඩී/2002 දරන චක්‍ර ලේඛය | අවස්ථා 03 කදී කර්මාන්ත පර්පාලන වියදම්වලින් රු.225,250 ක් වාහන අලුත්වැඩියාව සහ පුවත්පත් දැන්වීම් සඳහා ගෙවා තිබුණි. |
| (ඈ) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2004 අප්‍රේල් 11 දිනැති අංක සිපිසි/ සිඑස්/ 06/ 06/02 දරන චක්‍රලේඛ ලිපිය | ඇප තැබිය යුතු නිලධාරින් 06 දෙනෙකුගෙන් රු. 20,000 ක ඇප ලබාගැනිමට කටයුතු කර නොතිබුණි. |

## 2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,321,905 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,109,674 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 1,130 | 1,129 | 759 | 1,019 | 1,163 | 615 |
| (ii) | බදු කුලී | 1,971 | 857 | 1,430 | 1,670 | 1,206 | 536 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 991 | 1,142 | 136 | 927 | 1,079 | - |
| (iv) | වෙනත් ආදායම් | 22,089 | 18,146 | 6,775 | 23,980 | 17,008 | 19,304 |

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු 114,998 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු. 2,665,218ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි

### 2.2.4 බදු කුලි

2008 වර්ෂයේ සිට බදුකරුවන් 03 දෙනෙකුගෙන් අයකරගත යුතු රු.141,503 ක බදු කුලි මුදලක් 2010 දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පෞද්ගලික පඩිනඩි | 16,182 | 13,395 | 2,787 | 15,452 | 14,237 | 1,215 |
| අනෙකුත් | 5,986 | 5,556 | 430 | 6,559 | 5,109 | 1,450 |
| උප එකතුව | 22,168 | 18,951 | 3,217 | 22,011 | 19,346 | 2,665 |
| ප්‍රාග්ධන වියදම | 48,300 | 36,844 | 11,456 | 27,070 | 34,415 | (7,345) |
| මුළු එකතුව | 70,468 | 55,795 | 14,673 | 49,081 | 53,761 | (4,680) |

2.4 ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගැනිම

2010 වාර්ෂික අයවැය ලේඛනය මගින් වැය විෂයයන් 07 ක් සඳහා සලසා දී තිබු රු.782,000 ක ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා යොදා නොගෙන මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

2.5 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයක | 24 | 18 |
| ප්‍රාථමික | 22 | 18 |
| වෙනත් (අනියම්, තාවකාලික) | 01 | 19 |

2.6 වත්කම් කළමනාකරණය

2.6.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2007 වර්ෂයේ සිට වටිනාකම රු. 4,486 ක්වූ විදුලි උපකරණ ඒකක 115 ක් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිත පැවතුණි.

(ආ) 2009 ඔක්තෝබර් 23 දින අනතුරකට භාජනයවී තිබ සභාව සතු අංක 49-0253 දරන වාහනය විගණන දිනවූ 2011 මැයි 10 දින වන විටත් නිශ්ක්‍රියව ගාල්කර පැවතුණි.

2.6.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 1,522,559 ක් වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 181,457 ක් විය.

2.6.3 අයවීමට ඇති සේවක ණය

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 466,829 ක්වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු. 26,490 ක් විය.

(ආ) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4:4 උප වගන්තිය පරිදි මියගිය සේවකයින්ගෙන් අය විය යුතු ණය මුදල් ඔවුන්ගේ මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇප කරුවන්ගෙන අය කල යුතු වුවත්, දැනට වසර දෙකකට පමණ කාලයකට පෙර මියගිය ආදේශක රියදුරෙකු ගෙන් අයවිය යුතු රු.22,098 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, අයවී නොතිබුණි. ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 10:2 උප වගන්තියේ ඇතුලත් විධිවිධාන අනුව මොනු දරන ලද තනතුර සඳහා ආපදා ණය මුදලක් ලබාගැනිමට හිමිකම් නොමැති බව නිරීක්ෂණය විය.

2.7 වාහන උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 රජයේ ටෙන්ඩර් ක්‍රියාපරිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 9:3:1 (බි) ඡේදයේ උපදෙස් අනුව රු.100,000 කට වැඩි අලුත්වැඩියා සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්වරයාගේ පුර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව රු.180,250 ක් වැය කර සභාව සතු අංක 252-6528 දරන ට්‍රැක්ටරය අලුත්වැඩියා කර තිබුණි.

(ආ) සභාව සතු අංක සිපිජ්ඵ්-7199 දරන බැකෝ යන්ත්‍රය සඳහා රක්ෂණ ආවරණය 2010 මාර්තු 17 වන දිනෙන් අවසන් වි ඇතත්, විගණන දිනවු 2011 මැයි 10 දින වන විටත් ඉන් ඉදිරියට රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි.

2.8 හඳුනාගත් පාඩු හා හානි

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ ටූපදෙස්වලට පටහැනිව කටයුතු කිරිම වෙනුවෙන් රු.2,200 ක අධිභාරයක් ගෙවිමට සිදුවි තිබුණි.

(ආ) වෙලේ කඩේ පොදු වැසිකිලියේ ජලබිල්පත් නියමිත පරිද නොගෙවීමේ හේතුවෙන් නැවත සන්ධි කිරීමේ ගාස්තු රු.11,760 ක් ගෙවා තිබුණි.

2.9 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව පොදු වැදගත්කමින් යුත් සුභ සාධන පහසුකම් වෙනුවෙන් එක් වර්ෂයකට මුලු එකතුව රුපියල් එක්දහස නොඉක්මවන පරිදි ආධාර මුදල් ප්‍රදානය හැකි වුවද, අදාල අමාත්‍යාවරයාගේ අනුමැතියකින් තොරව රු.77,176 ක් ගෙවා තිබුණි.

2.10 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විථිපහන් නඩත්තු කිරිම වෙනුවෙන් 2007 සිට 2010 වර්ෂය දක්වා කාලයට අදාලව රු.165,130 ක මුදලක් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

2.11 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය
(ඇ) තොග පාලනය
(ඉ) වාහන පාලනය